**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2022**

**-----------------------------------------------------------------------------------**

**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සහ 2016 නොවැම්බර් 02 දින එළඹි අංක 3431 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසුණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකා පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. ණය ගිවිසුම් අංක 2790 එස්ආර්අයි (එස්එෆ්) ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940කට සමාන එජඩො මිලියන 68.8 ක් වූ අතර ඉන් රු.මිලියන 7,670කට සමාන එජඩො මිලියන 59ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ඉතිරි ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 1,339.33කට සමාන එජඩො මිලියන 9.8ක් ශ්‍රී ලංකා රජය දායක වීමට එකඟ වී තිබුණි. පසු ණය ගිවිසුම් අංක 3431 එස්ආර්අයි (එස්එෆ්) අනුව, මුල් ව්‍යාපෘතියේ කාර්යසාධනය පුළුල් කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 8,700කට සමාන එජඩො මිලියන 60ක අතිරේක ණය මුදලක් ලබාගෙන තිබුණි. ශ්‍රී ලංකා රජයේ රු.මිලියන 1,071.47කට සමාන එජඩො මිලියන 7.8ක දායකය සමඟ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,771.47කට සමාන එජඩො මිලියන 67.8ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.**

**1.3 මතය**

**ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වර්ෂය තුළ 04ක් පැවැත්විය යුතු වේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් දෙකක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

**3** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතිය පළාත් 07 ක පළාත් පාලන ආයතන 105 ක ඔවුන්ගේ යටිතල පහසුකම් අවශ්‍යතා වැඩිදියුණු කර ගැනීමට සහයෝගය දක්වා තිබුණු අතර, 2017 වර්ෂය අවසාන වන විට අදාළ පළාත් පාලන ආයතන 178ක සංවර්ධන කටයුතු සම්පූර්ණ කර තිබුණි. තවද, අතිරේක ණය පහසුකම් යටතේ පළාත් පාලන ආයතන 29 ක ජල සම්පාදන ව්‍යාපෘති 29 ක්, ඉදිකිරීම් කටයුතු 35ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණි. පෙර වර්ෂය තුළ දී ජල සම්පාදන ව්‍යාපෘති 29න් ව්‍යාපෘති 19ක් සම්පූර්ණ කර තිබූ නමුත් ව්‍යාපෘති 10ක් නිම කිරීමට මාස 08-24ක ප්‍රමාදයක් ඇති විය. සිවිල් වැඩ 35 න් යටිතල පහසුකම් ව්‍යාපෘති 33 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිම කරන ලද නමුත්, ඉදිකිරීම් 8 ක් මාස 3-31 ක කාල ප්‍රමාදයකින් යුක්ත විය.

**3.2** වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘතිවල කටයුතු

2017 අප්‍රේල් මසට පෙර පහත සඳහන් උප ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිතව තිබුණද, 2022 ජුනි 30 දක්වා එම උප ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| අංකය | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට නියමිත දිනය | ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | තණමල්විල සහ හම්බේගමුව බෙදාහැරීම් පද්ධතිය සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමය | 2017 අප්‍රේල් | 1,270 | පාරිසරික අධ්‍යයනයන්හි ඇති අමතර පිරිවැය සහ ගැටලු සැලකිල්ලට ගනිමින් මෙම උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කිරීම හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ සැලැස්ම සංශෝධනය කළ යුතුය. |
| (ආ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා ජල පිරිපහදුව ඉදිකිරීම. | -එම- | 430 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | මධ්‍යම පළාතේ ගැඹුරු නල ළිං පොම්පාගාර ඉදිකිරීම සහ ක්ලෝරීන් මිශ්‍රකරණය (3ක්) | -එම- | 60 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව මෙම ළිඳෙන් ප්‍රමාණවත් ජලය ලබා ගත නොහැකි බව පෙනී ගොස් ඇත. | -එම- |
| (ඈ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා රඳවා ගැනීමේ ටැංකි ඉදිකිරීම | -එම- | 100 | පාරිසරික අධ්‍යයනයන්හි ඇති අමතර පිරිවැය සහ ගැටලු සැලකිල්ලට ගනිමින් මෙම උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී. | -එම- |
| (ඉ) | කොටගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | -එම- | 50 | ජාතික මෙහෙයුම් කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටලු නිසා ඉවත් කර ඇත. | -එම- |
| (ඊ) | ආගරපතන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | | | | |

3.3 නිශ්කාර්ය /භාවිතයට නොගත්/ ඌන උපයෝජිත සම්පත්

(අ) පෙරටු කාර්යාල පද්ධතිය සහ ඉ-පුරනැගුම මෘදුකාංගය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | ව්‍යාපෘතිය විසින් ප්‍රාදේශීය සභා 137ක් සඳහා දෘඩාංග සමග ඉදිරිපස කාර්යාල පද්ධතිය ලෙස හඳුන්වන තාක්ෂණික විසඳුමක් ක්‍රියාත්මක කර තිබුණි. අලුතින් හඳුන්වා දෙනු ලැබූ "පෙරටු කාර්යාල පද්ධතිය"ට සහය ලබාදීමට පසුපෙළ කාර්යාල පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු අත්පත් කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මධ්‍යම පළාතේ සහ උතුරු මැද පළාතේ පවතින පළාත් පාලන ආයතන 41 කින් ප්‍රාදේශීය සභා 17ක් ඉහත පද්ධතිය සම්පූර්ණයෙන් භාවිතා කර නොතිබුණු අතර ප්‍රාදේශීය සභා 16ක් ඉහත පද්ධතිය ක්‍රියාත්මක නොකර විකල්ප නව මෘදුකාංග මිලදී ගෙන තිබුණි. | පෙරටු කාර්යාල පද්ධතිය යනු තොරතුරු තාක්ෂණ මැදිහත්වීම් සඳහා ප්‍රවේශ මට්ටමක් ලෙස අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභා සඳහා සකස් කරන ලද සරල විසඳුමකි. සියලුම මොඩියුල සම්පූර්ණයෙන් යොදා නොගැනීම සම්බන්ධයෙන්, ඇතැම් ප්‍රාදේශීය සභා වරිපනම් බදු අය නොකරන බවත් එවැනි ප්‍රාදේශීය සභාවල මෙම ක්‍රමය ක්‍රියාත්මක නොවන බවත් කරුණාවෙන් සලකන්න. අදාළ ප්‍රාදේශීය සභාවලින් හෝ පළාත් සභාවලින් තීරණ ගෙන ඇති බැවින් ප්‍රාදේශීය සභා විසින් වෙනත් පද්ධති අත්පත් කර ගැනීම වැළැක්වීමට ව්‍යාපෘතියට බලයක් නොමැති බව ද කරුණාවෙන් සලකන්න. | මෘදුකාංගයේ පවතින අඩුපාඩු නිවැරදි කළ යුතු අතර අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් සහ මෘදුකාංග භාවිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | වයඹ පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සියලු පළාත් පාලන ආයතන සඳහා ඊ - පුරනැගුම මෘදුකාංගය හඳුන්වා දී තිබුණද දැනට වයඹ පළාතේ කිසිදු පළාත් ආයතනයක එය ක්‍රියාත්මක නොවන අතර ඊ-පුරනැගුම මෘදුකාංගය ස්ථාපිත කර තිබූ රිදීගම ප්‍රාදේශීය සභාවෙහි එය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු විසඳාගැනීම සඳහා පුරනැගුම ව්‍යාපෘතිය විසින් මැදිහත් නොවීම මත වසර දෙකක සිට එම මෘදුකාංගය අක්‍රිය තත්ත්වයේ පැවතිණි. | පුරනැගුම ව්‍යාපෘතිය **2021** වර්ෂයේදී අවසන් වීමට නියමිත බැවින් පෙරටු කාර්යාල හා ඊ පුරනැගුම වැඩකටයුතු සම්බන්ධයෙන් **2021.02.28** දිනෙන් පසුව ව්‍යාපෘති කාර්යය මණ්ඩලයේ මැදිහත් වීමක් සිදු කළ නොහැකි බව **2020.09.17** දින පැවති ජාතික මෙහෙයුම් කමිටු සාකච්ඡාවේදී තීරණය විය. | දරන ලද වියදම නිශ්කාර්ය වීම වළක්වාගැනීම සඳහා වැඩසටහනක් දියත් කල යුතුය |

(ආ) වත්කම් කළමනාකරණ මෘදුකාංගය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **2018** දෙසැම්බර් **15** වැනි දින ඕස්ට්‍රේලියානු පෞද්ගලික සමාගමක් සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමක් යටතේ පළාත් හතක ප්‍රාදේශීය සභා හතක් සඳහා උප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම උප ව්‍යාපෘතියේ අරමුණ වන්නේ නියමු ව්‍යාපෘතියක් ලෙස වත්කම් කළමනාකරණ මෘදුකාංග නිර්මාණය කිරීමයි. **2006** ජනවාරි **25** දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ චක්‍රලේඛ අංක **08** මගින් අවශ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත්වලින් තොරව විදේශීය පෞද්ගලික සමාගමක් මෙම කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගෙන ඇති බව නිරීක්ෂණය විය. ඉහත ගිවිසුමේ ආධාරක සහ නඩත්තු පද්ධතිය සඳහා ප්‍රතිපාදන නොමැති බව වැඩිදුරටත් අනාවරණය විය. තවද, ශ්‍රී ලංකාවේ පළාත් පාලන අංශයේ පවතින නීතිරීති සහ අත්පොත් අධ්‍යයනය කිරීමෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැත. ඉහත ගිවිසුමේ වැඩ සැලැස්මට අනුව, ක්‍රියාකාරකම් ස්ථාපනය කිරීම සහ “පුහුණු ද්‍රව්‍ය සංවර්ධනය කිරීම සහ සම්පූර්ණ කාර්ය මණ්ඩල පුහුණුව” **2019** දෙසැම්බර් **31** දිනට සැලසුම් කර ඇති පරිදි නිම කර නොතිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ උපදෙස් මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ අමාත්‍යාංශය වෙනත් සමාන ආයතන (පවතී නම්) වෙත අවස්ථාව ලබාදීමට මෙම ප්‍රසම්පාදනය සඳහා **CQS** ක්‍රමය අනුගමනය කර ඇත. එමනිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් නොමැත. | අවශ්‍ය ගුණාත්මක බව සහතික වෙමින් කටයුතු කඩිනමින් නිමකිරීමට ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරු පෙලඹවීමට අවශ්‍ය වේ. |
| **(ii)** | මෘදුකාංගය ස්ථාපිත කරන ලද පළාත් පාලන ආයතන **07**න් **05**ක සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී එකී ආයතනවල මෘදුකාංගය ස්ථාපිත කරන අවස්ථාවේ ඇතුලත් කරන ලද වත්කම්වල දත්ත පමණක් මෘදුකාංගයේ දත්ත පද්ධතිය තුල පවතින අතර එම දත්ත යාවත්කාලීන කර නොතිබුණි. තව ද එම දත්ත භාවිතා කර වත්කම් කළමනාකරණය සඳහා තීරණ ගත හැකි ආකාරයට තොරතුරක් මෙම මෘදුකාංගය හරහා සකස් කර | මූලිකව ව්‍යාපෘතියේ කාර්යභාරය වූයේ ප්‍රාදේශීය සභාවල දැනට පවතින අංග සම්පූර්ණ දත්ත මෙම පද්ධතියට ඇතුලත් කර මෘදුකාංගය හැසිරවීම සම්බන්ධ සියලු පුහුණුවීම් ලබා දීමය. ඒ අනුව අවශ්‍ය සියලු පුහුණුවීම් ලබා දී ඇති බැවින් | ව්‍යාපෘති කාලය තුල වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා සහ ඉන් පසු ඇතිවන තාක්ෂණික ගැටළු විසඳීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම වැනි අඛන්ඩ ක්‍රියාවලියක් පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| පරිශීලකයාට ලබා ගත නොහැකි බවත් පළාත් පාලන ආයතන විසින් මෘදුකාංගය භාවිතයට නොගෙන තම අවශ්‍යතා ඉටු කර ගැනීමට පැතුරුම්පත් භාවිතා කරන බව නිරීක්ෂණය වූ බැවින් ඇ.එ.ජ. ඩොලර් **133,747.70** ක් වැයකොට නිෂ්ඵල මෘදුකාංගයක් ස්ථාපිත කර ඇති බව නිරීක්ෂණය විය. | යාවත්කාලීනව පවත්වා ගැනීම සභාවේ වගකීමකි. | |

(ඇ) ජලසම්පාදන ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ජල සම්පාදන පහසුකම් නොමැතිකම, ප්‍රවේශ මාර්ග නොමැතිකම, ගොඩනැගිලි සැලසුම්වලට අනුකූල නොවීම, ආදාහනාගාරයක් සඳහා මහජන ඉල්ලුමක් නොමැතිකම, ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම, ජල ටැංකි ඉදිකිරීමේදී බිම් මට්ටම සැලකිල්ලට නොගැනීම, **Covid-19** වසංගතයේ බලපෑම, ජල පිරිපහදු යන්ත්‍රවල ප්‍රමාණවත් ධාරිතාවක් නොමැතිකම සහ ශ්‍රවණාගාරය/ප්‍රජා ශාලාව ප්‍රයෝජනයට ගැනීම සඳහා නිසි සැලසුමක් නොමැතිකම හේතුවෙන් ආරම්භ කර අතරමඟ නවතා තිබූ ව්‍යාපෘති **33**ක් සඳහා රුපියල් මිලියන **3,809**ක් වැය කර තිබුණි. | විවිධ හේතු නිසා ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි විය | සාමාන්‍ය ජනතාවට ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘතිය අවසන් කළ යුතුය. |

**3.4** මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| තාක්ෂණික විගණනය සිදුකිරීමට වර්ෂයක කාලයක් සඳහා තනි පුද්ගල උපදේශක වරයෙකු ලෙස ඉංජිනේරුවරයෙකු තෝරාගෙන තිබුණි. පසුව ඔහුගේ සේවා කාලය **2019** නොවැම්බර් දක්වා දීර්ඝ කර ඇත. අමාත්‍යාංශයේ ලේකම් සහ තාක්ෂණික විගණන උපදේශක විසින් අත්සන් කරන ලද ගිවිසුමට අනුව, පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය විසින් වරින් වර සපයනු ලබන පරිශීලන නියමයන් සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව විගණනය සිදු කර යොමු කොන්දේසි යටතේ අර්ථ දක්වා ඇති පරිදි විවිධ අරමුණු කාර්යයන් පිළිබඳ නිශ්චිත කොටසක් ඇතුළත් කළ යුතු විය. තාක්ෂණික විගණන උපදේශකවරයා විසින් අවසාන වාර්තාවේ ප්‍රධාන ගැටළු සහ නිර්දේශ සටහන් කළ යුතු වුවද; වාර්තාවේ ප්‍රධාන ගැටළු සහ නිර්දේශ කිසිවක් අඩංගු වී නොතිබුණි. | තාක්ෂණික විගණන උපදේශක කොන්ත්‍රාත් ප්‍රසම්පාදනය සිදු කිරීමට ව්‍යාපෘති කළමණාකරන ඒකකයට සහාය වී ඇත. | ව්‍යාපෘතිය ගෙවීම අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.5 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය ආවරණය වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය පුළුල් කර ඇත. කෙසේ වෙතත් සමාලෝචිත වසර තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | අභ්‍යන්තර විගණනය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතුය |